වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
வியாபார, தீர்வை மற்றும் முதலீட்டுக் கொள்கைத் திணைக்களம்
Department of Trade, Tariff and Investment Policy

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் அமைச்சு
Ministry of Finance and Planning

මහ ලේකම් කාර්යාලය, කොළඹ – 01.
செயலகம், கொழும்பு – 01
The Secretariat, Colombo – 01.

මගේ අංකය. / எனது இல. / My No.: ටීටීඅයිපී/01/2007(1)

ඔබේ අංකය. / உமது இல. / Your No.:

දිනය. / திகதி. / Date.: 2007.06.29

සියළු අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් වෙත,

<u>අනුග්‍රාහක පදනම මත වාහන ආනයනය කිරීම</u>

සුදුසුකම් ලබන රජයේ නිලධාරීන් සඳහා අනුග්‍රාහක පදනම මත වාහන ආනයනය කිරීම සඳහා නිකුත් කරන ලද 2007.03.30 දිනැති වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01 හා එය සංශෝධනය කරමින් නිකුත් කරන ලද 2007.04.16 දිනැති වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01 (i) හා බැඳේ.

02. මෙම චක්‍රලේඛයේ සඳහන් කරුණු සංශෝධනය කරමින් ව්‍යාජ උපදෙස් මාලාවක් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලිපි ශීර්ෂ සමඟ මගේ අත්සන ව්‍යාජ ලෙස යොදා ගනිමින් නිකුත්කර ඇති බව අනාවරණය වී ඇත.

03. අනුග්‍රාහක පදනම මත වාහන ආනයනය කිරීම වෙනුවෙන් නිකුත් කරන ලද 2007.03.30 දිනැති වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01 යටතේ වාහනයක් ආනයනය කිරීම සඳහා සුදුසුකම් ලබන නිලධාරීන් පිළිබඳ හෝ අළුත්ම වාහනයක් පමණක් ආනයනය කිරීම සඳහා සලසා ඇති ප්‍රතිපාදන ඇතුළු අනෙකුත් කොන්දේසි සංශෝධනය කිරීමක් මේ දක්වා සිදුකර නොමැති බව අවධාරනය කරමි.

04. භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන සෑම චක්‍රලේඛයක්ම විධිමත් ලෙස සකස් කර ඔබ වෙත ලැබීමට සලස්වන අතර එය භාණ්ඩාගාර අන්තර්ජාල පිටුව මඟින්ද ප්‍රසිද්ධ කරනු ලැබේ. සෑමවිටම භාණ්ඩාගාරය විසින් නිකුත්කරන චක්‍රලේඛ අන්තර් ජාලය ඔස්සේ පරීක්ෂා කිරීම තුලින් තහවුරු කර ගැනීම වඩාත් සුදුසු බව අවධාරණය කරමි.

05. මේ පිළිබඳ හෝ ඉදිරියේදී ඇතිවිය හැකි මේ හා සමාන කරුණු පිළිබඳ යම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වේ නම් භාණ්ඩාගාරයේ වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ පහත නම් සඳහන් නිලධාරීන් අමතන ලෙස දන්වමි.

| | | | |
|---|---|---|---|
| ආර්.එච්.එස්. සමරතුංග මහතා | - | අධ්‍යක්ෂ ජනරාල් - | 2484930 |
| හේමාල් කස්තුරිආරච්චි මහතා | - | අධ්‍යක්ෂ - | 2484850 |
| එන්.කේ.ජ්.කේ.නැම්මවත්ත මහතා | - | අධ්‍යක්ෂ - | 2484784 |
| පි.බි.එස්.සී.නෝනිස් මහතා | - | සහකාර අධ්‍යක්ෂ - | 2484939 |

පී. බී. ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම්

කථන අංකය / தொலைபேசி இல, / Telephone: 011-2484888
ෆැක්ස් / பக்ஸ் / Fax: 011-2484892
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-Mail: admin @ ttipd.treasury.gov.lk
වෙබ් අඩවිය / இணையத்தலம் / Website: www.treasury.gov.lk